**ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතිය එච්අයිවී/ඒඩ්ස් නව මූල්‍යයන ආකෘතිය සංරචකය - 2017**

---

ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ එච්අයිවී/ඒඩ්ස් නව මූල්‍යයන ආකෘතිය සංරචකයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල අතර 2015 නොවැම්බර් 26 දින එළඹි අංක 977-එල්කේඒ-එච්-එම්ඕඑච් දරන ප්‍රදාන ගිවිසුමේ 13(ආ) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ප්‍රදාන ගිවිසුමට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරයි. ශ්‍රී ලංකාවේ එච්අයිවී/ඒඩ්ස් වැලැක්වීම, පාලනය කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා ජාතික වැඩ සටහන් ඉහල නැංවීමට කටයුතු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. එච්අයිවී/ඒඩ්ස් පාලනය සඳහා වූ කඩිනම් ව්‍යාපෘතියේ නව මූල්‍යයන ආකෘතිය සංරචකයේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො 5,323,102 ක් වන අතර, සම්පූර්ණ මුදලම මූල්‍යයනය කිරීමට ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු නව මූල්‍යයන ආකෘතිය සංරචකය යටතේ 2016 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර, 2018 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා  පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල  දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**------------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්රකාශන**

**----------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති

බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර (විප්‍ර) සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම එජඩො මිලියන 1.64 කට සමාන රු.මිලියන 250.08 ක් සහ 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.මිලියන 426.17 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා දරන ලද වියදම ඉකුත් වර්ෂය සඳහා දරන ලද වියදම හා 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම, පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | | | 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|---|---|
| | 2017 | | 2016 | | |
| | එජඩො | රු. | එජඩො | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ | 125,779 | 19,031,556 | 59,415 | 23,567,844 | 42,599,400 |
| එච්අයිවී/ඒඩ්ස් පාලන කටයුතු | 1,515,474 | 231,049,381 | 1,045,856 | 152,517,188 | 383,566,569 |
| එකතුව | 1,641,253 | 250,080,937 | 1,105,271 | 176,085,032 | 426,165,969 |

### 2.2.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2016 සහ 2017 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ව්‍යාපෘතියේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා | | | |
|---|---|---|---|---|
| | **2017** | | **2016** | |
| | එජඩො | රු. | එජඩො | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | | | |
| විදේශීය මූලාශ්‍රවලින් ලද මුදල් | 878,933 | 134,000,000 | 627,442 | 91,500,000 |
| දේශීය මූලාශ්‍රවලින් ලද දායකත්වය | 193,904 | 29,562,062 | 89,145 | 13,000,000 |
| ප්‍රදාන නියෝජිතායතනයේ සෘජු විය පැහැදම | 360,652 | 54,984,969 | 407,557 | 59,434,020 |
| වෙනත් මූලාශ්‍රවලින් මුදල් ලැබීම් | - | - | 288 | 42,000 |
| වැඩසටහන් වියදම් | (1,515,474) | (231,049,381) | (1,045,856) | (152,517,188) |
| වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාවය) | (90,955) | (13,866,957) | 75,029 | 10,941,504 |
| ක්ෂය | 73,328 | 11,179,613 | 77,656 | 11,324,518 |
| වර්ෂය සඳහා පාරිතෝෂික | 1,908 | 320,582 | - | - |
| ගෙවිය යුතු ශේෂ වැඩිවීම | 141,453 | 21,427,423 | 7,526 | 1,268,821 |
| තොග වැඩිවීම | (191) | (29,105) | - | - |
| ලැබිය යුතු ශේෂ වැඩිවීම | - | - | 224 | 33,000 |
| විදේශ විනිමය පාඩු/ලාභ | (732) | - | (1020) | - |
| මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් | 133,781 | 20,396,163 | (159,415) | (23,567,844) |

| | | | | |
|---|---|---|---|---|
| **ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | | | |
| ස්ථාවර වත්කම් ප්‍රසම්පාදනයන් | (124,830) | (19,031,556) | (159,415) | (23,567,844) |
| ආයෝජන කාර්යයන් සඳහා යොදවන ලද ශුද්ධ මුදල් | (124,830) | (19,031,556) | (159,415) | (23,567,844) |
| මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය | | | | |
| ආපසු දුන් මුදල් | (8,951) | (1,364,607) | (3,547) | (517,328) |
| ආයෝජන කටයුතුවල යොදාගත් ශුද්ධ මුදල් | (8,951) | (1,364,607) | (3,547) | (517,328) |
| **මුදල් ශුද්ධ වැඩිවීම** | **නැත** | **නැත** | **නැත** | **නැත** |

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ එච්අයිවී/ඒඩ්ස් නව මූල්‍යායන ආකෘතිය සංරචකයේ කාර්යයන් 2016 ජනවාරි 01 සිට ආරම්භ කර තිබුණද, පෙර ව්‍යාපෘතිය විසින් 2015 දෙසැම්බර් 31 දින දක්වා පිරිවැය රු.මිලියන 69.99 කට ප්‍රසම්පාදනය කර රේඛීය අමාත්‍යාංශයට භාරදෙන ලද දේපල, පිරියත හා උපකරණ ව්‍යාපෘතියේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 134ක මුදලක් ශ්‍රී ලංකා රජය විසින් දායක වී තිබුණද, ශ්‍රී ලංකා රජයේ දායකය ලෙස රු.මිලියන 132.64 ක මුදලක් ආදායම් ප්‍රකාශනයට ගෙන තිබුණි.

**2.2.4 නොසැසඳූ ශේෂ**

-----------------

ව්‍යාපෘතියේ මූල්‍ය තොරතුරු මහා භාණ්ඩාගාරය විසින් පවත්වා ගෙන යන ලද වාර්තා සමඟ සැසඳීම සඳහා ව්‍යාපෘති නියාමන ඒකකය කටයුතු කර නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සමාලෝචිත වර්ෂය සඳහා කරන ලද රු.මිලියන 54.98 කට සමාන එජඩො 360,652 ක ඍජු වියපැහැදම භාණ්ඩාගාර වාර්තාවල සටහන් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනවන විට එකතුව රු.මිලියන 39.4 ක් වැයකර තිබූ අයවැය සීමා කාර්යයන් 15 ක් යටතේ, පරාසය සියයට 40 සිට සියයට 100 ක භෞතික ප්‍රගතියක් ළඟා කරගෙන තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, එක් එක් කාර්යයන් යටතේ ඉලක්ක ළඟා කරගැනීම් පිළිබඳ විස්තර මැනුම් කර ප්‍රගති වාර්තාවල දක්වා නොතිබුණි. ඊට අදාළ වැඩ හා සේවා සම්පාදනයන් හා ගෙවීම් විස්තර ආදී අනුරූපී තොරතුරු අදාළ ලිපිගොනුවල ලබාගත නොහැකි විය.

(ආ) E-Mis පද්ධතිය සඳහා පිරිවැය රු.මිලියන 3.84 ක්වූ පරිගණක 35 ක් ප්‍රසම්පාදනයට අදාළ අනුරූපී ලිපිගොනු, භෞතික සත්‍යාපන වාර්තා සහ අනෙකුත් තොරතුරු ආදී සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) ලැබී තිබූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ ඒකාබද්ධ ජීව විද්‍යාත්මක හා චර්යාත්මක නිරීක්ෂණ සමීක්ෂණ (Integrated Biological and Behavioural Surveillance Survey) යටතේ කාර්යයන් නිමකර තිබුණි. කෙසේ වුවද, භාර ගැනීමේ ලිපියේ පිටපත්, සමීක්ෂණ වාර්තා හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

-------------------------------------------

මුදල් රෙගුලාසි 371(5) හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව, අවස්ථා 26 කදී රු.100,000 ක උපරිම සීමාව ඉක්මවා එකතුව රු.මිලියන 8.93 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. තවද, අවස්ථා 42 කදී ලබා දී තිබූ එකතුව රු.මිලියන 4.35 ක් වූ අතුරු අග්‍රිම සති 01 සිට මාස 03 දක්වා කාල පරිච්ඡේදයක ප්‍රමාදයන් සහිතව නිරවුල් කර තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

----------------------------------

**3.1 අරමුදල් උපයෝජනය**

---------------------------

අරමුදල් මූලායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, වර්ෂය තුළදී ලැබුණු අරමුදල් හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමේ මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ මුදල | | 2017 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන් තුවේ කරන ලද වෙන්කිරීම | සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | | 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජීඑෆ්ඒටීඑම් | 5.32 | 707.56 | 222.5 | 1.23 | 187.62 | 2.14 | 320.5 |
| ශ්‍රී ලං ර | - | - | - | 0.19 | 29.56 | 0.28 | 42.56 |
| එකතුව | 5.32 | 707.56 | 222.5 | 1.42 | 217.18 | 2.42 | 363.06 |

ඉහත තොතුරු අනුව, 2017 දෙසැම්බර් 31 දින වනවිට මුළු ප්‍රතිපාදනය වූ එජඩො මිලියන 5.32 කට සමාන රු.මිලියන 707.56 කින් සියයට 40 ක් නියෝජනය කරන එජඩො මිලියන 2.14 කට සමාන රු.මිලියන 320.50 ක් උපයෝජනය කර තිබුණි. තවද ගෝලීය අරමුදලින් ප්‍රතිපූර්ණය කරන ලද රු. මිලියන 9.87 ක උපයෝජනය නොකරන ලද ශේෂයක් 2017 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරයේ පැවතුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති කාර්යයන් අයවැය පිරිවැය වර්ගීකරණයන් 13 ක් යටතේ අයවැය සීමා කාර්යයන් 213 ක් මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වනවිට අයවැය සීමා කාර්යයන් 13 ක් ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස, රු.මිලියන 56.65 ක වෙන්කිරීම් උපයෝජනය කර නොතිබුණි. තවදුරටත් ප්‍රගති වාර්තා අනුව, 2017 දෙසැම්බර් 31 දිනට අයවැය සීමා කාර්යයන් 17 ක භෞතික ප්‍රගතිය සියයට 40 කට වඩා අඩු මට්ටමක පැවතුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය මගින් භෞතික ප්‍රගතිය පිළිබඳ වාර්තා පවත්වා නොගැනීම හේතුවෙන් අයවැය සීමා කාර්යයන් යටතේ ක්‍රියාත්මක කර තිබූ කාර්යයන්හි භෞතික ප්‍රගතිය විගණනයේදී විධිමත් පරිදි තහවුරු කර ගැනීමට නොහැකි විය. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැය සීමා කාර්යයන් 10 ක් සමාලෝචිත වර්ෂය තුළ නිමකර තිබූ බවට ප්‍රගති වාර්තාවල දක්වා තිබුණද 2017 දෙසැම්බර් 31 දිනට තත්‍ය භෞතික ප්‍රගතිය සියයට 10 සිට සියයට 70 දක්වා වූ පරාසයක් තුල පැවතුණි. මීට අමතරව ප්‍රගති වාර්තාවල දක්වා තිබූ රු.මිලියන 166.7 කට ක්‍රියාත්මක කර තිබූ අයවැය සීමා කාර්යයන් 99 ක භෞතික ප්‍රගතිය ව්‍යාපෘතිය මගින් වෙන් වෙන්ව ඇගයීම් කර නොතිබුණි.

(ආ) අයවැය සීමා කාර්යයන් 8 ක් යටතේ විද්‍යුත් තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා එකතුව රු.මිලියන 5.82 ක් වැයකර තිබූ අතර, ඒ අතුරින් අයවැය සීමා කාර්යයන් 6 ක භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි. තවද, රු.මිලියන 17.55 ක වෙන්කිරීම් යටතේ ජාතික එච්අයිවී/ඒඩ්ස් පාලන වැඩසටහන සඳහා විද්‍යුත් තොරතුරු පද්ධතියක් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනට සියයට 70 ක භෞතික ප්‍රගතියක් ළඟාකර ගෙන තිබුණි. කෙසේ වුවද,

ළභාකරගෙන තිබූ භෞතික ප්‍රගතිය සනාථ කර ගැනීමට අදාල තොරතුරු නොතිබූ අතර ඊට අදාල ලිපිගොනු ද ඉදිරිපත් නොවුණි.

### 3.3 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ ගනුදෙනු සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට භාජනය කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. තවදුරටත්, ව්‍යාපෘතිය මගින් ආයතන වලට මාරුකළ වත්කම් උපයෝජනය කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) එච්අයිවී/ඒඩ්ස් සංරචකය යටතේ ලැබී තිබූ ප්‍රදාන සඳහා මුදල් රෙගුලාසි 610 ප්‍රකාරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 3.4 මානව සම්පත් කළමනාකරණය

---

ව්‍යාපෘතියේ අනුමත කාර්යමණ්ඩලය ක්‍රියාකාරී සම්බන්ධීකාරක තනතුරු 10 කින් සමන්විතව පැවති බව නිරීක්ෂණය වූ අතර ඒ අතුරින් තනතුරු 6 ක් 2017 දෙසැම්බර් 31 වනවිට වසර 2 කට අධික කාලයක සිට පුරප්පාඩුව පැවතුණි.

### 3.5 මතභේදයට තුඩුදෙන කරුණු

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒඩ්ස්, ක්ෂය රෝගය මැලේරියාව මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ එච්අයිවී/ඒඩ්ස් නව මූල්‍යයන ආකෘතිය සංරචකයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වරලත් ගණකාධිකාරී සමාගමක් තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කර, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය අමාත්‍යාංශය වෙත වෙනම විගණන වාර්තාවක් නිකුත් කර තිබුණි. කෙසේ වුවද, ඒ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ එකඟතාවය ඉල්ලා නොතිබුණි.